# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

## 2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

### මූලාශ්‍රය අධ්‍යයනය හා ආදි බෞද්ධ නිකාය BUPH E - 1025

**ප්‍රශ්න පහකට (5) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. බ්‍රහ්මජාල සූත්‍රාගත දෘෂ්ටි පිළිබඳ හැඳින්වීමක් කොට ශාස්වත - උච්ඡේද වශයෙන් දෘෂ්ටීන් ඇතිවීමට බලපාන හේතු තත් සූත්‍රයට අනුව පැහැදිලි කරන්න .

2. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් නිර්වාණගාමී ප්‍රතිපදාව ප්‍රකට වන ආකාරය සච්චවිභංග සූත්‍රයට අනුව ප්‍රකට කරන්න.

3. ඉන්ද්‍රියඥානයෙහි ප්‍රභවය හා විකාශය ප්‍රකට කරන දේශනාවක් වශයෙන් මධුපිණ්ඩික සූත්‍රයේ වැදගත්කම පෙන්වා දෙන්න.

4. හොඳ - නරක ක්‍රියා විනිශ්චය පිළිබඳ නිර්ණායකයක් වශයෙන් කාලාම සූත්‍රයේ උපයෝගීතාව ප්‍රකට කරන්න.

5. පටිච්චසමුප්පාද දේශනාව බුදුසමයේ ප්‍රධානතම දාර්ශනික සිද්ධාන්තය ලෙස සැලකිය හැකි අයුරු අභිසමය සංයුක්තාගත ඉගැන්වීම් අනුසාරයෙන් ප්‍රකට කරන්න.

6. මහාසාංඝික නිකාය පිළිබඳ හැඳින්වීමක් කොට තද් නිකායාගත මූලික ඉගැන්වීම් ඉදිරිපත් කරන්න.

7. ථෙරවාද සම්ප්‍රදායේ ප්‍රභවය, විකාශය හා අනන්‍යතා ලක්ෂණ පිළිබඳ මූලාශ්‍රයාගත අධ්‍යයනයක යෙදෙන්න.

8. 'පුද්ගලවාදය' යනු කුමක්දැයි මූලාශ්‍රය නයින් පැහැදිලිකොට, පුද්ගලවාදීන් සිය ඉගැන්වීම් මූලික සූත්‍රදේශනා ඇසුරින් සනාථ කිරීමට ගන්නා ලද උත්සාහය පෙන්වා දෙන්න.

9. සර්වාස්තිවාදය හඳුන්වා කාලත්‍රයවර්තී ධර්මයන්ගේ අස්තිත්වය තහවුරු කිරීමට තත් නිකායිකයින් විසින් ඉදිරිපත් කරන ලද සාධක ගෙනහැර දක්වන්න.

10. ' බහ්‍යාර්ථ අනුමෙය වාදය ' යනු කුමක්දැයි ක්‍ෂණය පිළිබඳ සෞත්‍රාන්තික විවරණය ඇසුරෙන් පැහැදිලි කරන්න.

**********************